කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි තෙවන වසර පරීක්ෂණය

පළමු සෙමෙස්තරය - 2016/2017

# SLG 3143 – සිංහල නාට්‍ය කලාව

(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට** (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. "නාට්‍ය වූ කලී අනුකරණය ආත්ම කොට ගත් කලා මාධ්‍යයකි." පෙරාපර දෙදිග නිර්වචන ඇසුරින් විමර්ශනයක යෙදෙන්න.

2. සංස්කෘත නාට්‍ය ශිල්පධර්ම සැකසී ඇත්තේ සුඛාන්ත නාට්‍යයක පසුබිම ප්‍රවර්ධනය වන පරිද්දෙනි. විග්‍රහයක යෙදෙන්න.

3. සිංහල නාට්‍ය කලාවේ ප්‍රභවය විෂයෙහි ඉපැරණි ශාන්ති කර්මවලින් ලැබූ පිටිවහල සනිදර්ශන ව පැහැදිලි කරන්න

4. නූර්ති නාඩගම් ලක්ෂණ අභිභවා කරළියට පැමිණිය ද චිරස්ථායී නාට්‍ය සම්ප්‍රදායයක් බවට පත් නො වී ය. සංසන්දනාත්මක ව විග්‍රහයක යෙදෙන්න.

5. පහත සඳහන් නාට්‍ය කෘති අතුරෙන් දෙකක රංග ශෛලී පැහැදිලි කරන්න.

    i. හුණුවටයේ කථාව
    ii. මනමේ නාට්‍යය
    iii. කැලණිපාලම
    iv. රත්නාවලී

*අ.පි.බ*

6. "සිංහබාහු නාට්‍යය මනුෂ්‍යත්වයට පොදු ආවේණික ගුණාංග විවරණය කරන්නකි." නිදසුන් සහිත ව මේ කියමන සාකච්ඡා කරන්න.

7. පහත දැක්වෙන නාට්‍ය රචකයන්ගෙන් දෙදෙනෙකු නාට්‍ය කලාවට දැක් වූ දායකත්වය අගයන්න.

i. දයානන්ද ගුණවර්ධන
ii. චාර්ල්ස් ඩයස් අමරතුංග
iii. හෙන්රි ජයසේන
iv. පිලිප්පු සිංඤ්ඤෝ
v. ආර් ආර් සමරකෝන්

********************